# Living the LOTUS

Buddhism in Everyday Life

10 2018

VOL. 157


FOUNDER'S ESSAY

## මෛත්‍රියෙන් කැගැසීමේ හඬ නියමාකාරයෙන් වර්ගකර ගැනීම

'අම්මා හරිම කරදරයක්, මරෙනවානම් හොදයි' යනුවෙන් දරුවන් පැවසුවහොත් එයින් දෙමාපියන්ගේ හිත වේදනාවට පත්වේ. නමුත් එහි යටපත් වී ඇත්තේ දෙමාපියන්ගේ උදව් බලාපොරොත්තු වන මෛත්‍රියෙන් කැගැසීමේ හඬ වේ. නමුදු විටෙක එම වචන හා මෛත්‍රියෙන් කැගැසීම හඬ එකට බද්ධ නොවන අවස්ථාවන්ද තිබේ.

තවත් විටෙක 'මාව ඇයි මේ ලෝකයට බිහි කලේ' ලෙස දරුවන් පවසන විට, දෙමාපියන්ට කේන්තියක් ඇතිවීම යනු දෙමාපියන් තම වගකීමෙන් පලා යාමට දරන උත්සහයකි.

දෙමාපියන්ගේ නිවැරදි ආදරය යනු, දරුවන් එවැනි ආකාරයට පවසන හේතුව නිදහසේ සැහැල්ලුවෙන් කල්පනා කිරීම වේ.

එසේ සැහැල්ලුව නැතිවූ විට දරුවන් පවසන වදන් වලට සිත එල්බගෙන කේන්තියෙන් බැන වැදීමටත්, දෑස නිලංකාර වීමටත් පුළුවන. එවැනි වදන් අපේ දරුවාගේ මුවින් පිට වුවේ මන්ද ලෙස හදපත්ලෙන්ම සිතා බැලීම 'නියම දක්ම' වේ.

කාර්යාල සේවකයන් රැකියාව අවසන් වී ගෙදරට යන අතරමඟ මත් පැනින් පදම්ව රැකියා ස්ථානයට හා ආයතන ප්‍රධානියාට ආදිය බැණ වදින ස්වරූපයන් දකින්නට හැකිවේ. එයද තවත් වර්ගයක මෛත්‍රියෙන් කැගැසීමේ හඬක් වේ.

අවලෝකිතේෂ්වර බෝධිසත්වයන්ට ඕනෑම කෙනෙකුව දුකින් මුදවා ගැනීමට හැකි වන්නේ, වේදනාවෙන් පීඩාවට පත් වූවන්ගේ කෑ ගැසීම තුලින් ඔවුන්ගේ නියම ප්‍රාර්ථනය වර්ග කර ගැනීමට හැකි නිසාය. අපිද එම හැකියාව දියුණු කරගෙන නියමාකාරයෙන් ශරීරයට ග්‍රහණය කරගැනීමට කටයුතු කරමු.

*Kaiso zuikan* 9 පි. 172-173


Living the Lotus
Vol. 155 (August 2018)



Rissho Kosei-kai International
Fumon Media Center 3F, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537 Japan
Tel: +81-3-5341-1124
Fax: +81-3-5341-1224
E-mail: living.the.lotus.rk-international
@kosei-kai.or.jp



**Senior Editor:** Koichi Saito
**Copy Editors:** P.A.D. Somapala, G.N. Ruklanthi, Sahan Chamara
**Editor:** Eriko Kanao
Editorial Staff of RK International


රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදි නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රය මූලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත් , කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන , සාමාකාමී ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි. වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මූලිකත්වයෙන් , සාමාජික සාමාජිකාවන් සෑම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.

Living the Lotus-Buddhism in Everyday Life (සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රය තුල ජීවත්වෙමු - එදිනෙද දිවියට බුදු දහම බද්ධ කර ගනිමු.) යන තේමාව තුල, එදිනෙද ජීවිතයට සද්ධර්ම පුණ්ඩරීක සුත්‍රයේ කියාදීම් බද්ධ කර ගෙන මඩෙහි පිපෙන්නාවු ලස්සන නෙලුම් මලක් සේ තම ජීවිතය සමෘද්ධිමත් කරගෙන, එලෙසම වැඩි වටිනාකමින් යුතු තත්වයට පත් විය යුතුය යන ප්‍රාර්ථනය ගැබ් වී ඇත. මෙම සඟරාව මඟින් ලෝකය පුරා ව්‍යාප්ත වී සිටින්නාවු සාමාජික සාමාජිකාවන් එදිනෙද දිවියට බුදුදහම බද්ධ කරගෙන කටයුතු කරන්නාවු අයුරු අන්තර්ජාල මාර්ගයෙන් බෙදහැරීම සිදු කරනු ලැබේ.



*President's Message*

# අන්‍යයන් සමග සැහැල්ලුවෙන් අධ්‍යාත්මික දියුණුව වෙත

**නිචිකෝ නිවානෝ**
**රිෂ්ෂෝ කෝසෙයි සංවිධාන ප්‍රධානී තුමා**

## ගහ කොළ වල පාට වෙනස් වනවාසේ

'සකුරා ගසෙහි කොළද සරත් සමය උදාවීමත් සමග පාට වෙනස්ව හැලිවැටෙයි'

මෙය සරත් කාලය උදාවන ආකාරය පිළිබඳ යොසා බූසාන් මහතාගේ පදවැල් තුලින් ගොඩනැගූ කවියකි. සකුරා ගසේ කොළ අනෙකුත් ගහ කොළ වලට පෙර හැලී යන ආකාරය එයින් නිරූපනය වේ. එසේම සරත් සමය උදාවත්ම නවතත් සකුරා මල් පීදෙයි, නැවතත් පත්‍ර හැලී යයි, මෙලෙසින් තමාට ලැබී තිබෙන ජීවය අව්‍යාජව ශ්‍රේෂ්ඨ ආකාරයෙන් ගත කරන සකුරා ගස ගැන හදේ භක්තියක් ඇතිවිය.

නමුත් අප ඉමහත් වෙහෙසකින් කටයුතු කරන විට, කැපවන විට, උත්සහ කරනවා හා ආධ්‍යාත්මික දියුණුවට ප්‍රයන්ත දරනවා යන වදන් භාවිතා කරයි. ඒ නිසාමදෝ උත්සහ කරන්න හා ආධ්‍යාත්මික දියුණුව ඇති කර ගන්න ලෙස ඇසෙන විට ඉල ඇට බිඳී යනවා වාගේ වේදනාවක් දැනෙයි.

ආගමික ජීවිතයේදී 'ආධ්‍යාත්මික දියුණුව, ආධ්‍යාත්මික දියුණුව, මැරෙන තෙක්ම ආධ්‍යාත්මික දියුණුව, නැවත ඉපදීත් ආධ්‍යාත්මික දියුණුව' ඇති කර ගත යුතුය ලෙස කටයුතු කිරීමට උත්සහ කරන විට නොදනුවත්වම සිතට භයක් ඇතිවේ.

නමුදු ආධ්‍යාත්මික දියුණුව යනු, අපහසුතාවයෙන් වැඩ කිරීමවත්, භීතියෙන් යුතුව උත්සහයෙන් කටයුතු කිරීමවත් නොවේ යැයි සිතමි.

ආධ්‍යාත්මික දියුණුව ඇති කර ගැනීම ජපන් භාෂාවෙන් 'ෂෝජින් 'ලෙස හඳුන්වයි. එහි 'ෂෝ' යන අකුරින් එයින් දිස්වන්නේ වී ඇටයක පොත්ත හා නිවුඩ්ඩ ඉවත්කර පිරිසිදු සහල් ඇටයක් බවට පත් වනවාසේ, අපද නුමුකළ සුපිරිසිදු හදවත්කට පත් වීමයි. එනම්, ධනාත්මක සිතුවිලි වලින් ජීවිතය ගත කිරීම ආධ්‍යාත්මික දියුණුව ලෙස පැවසේ. එසේම, 'ෂෝ' යන අකුරෙහි තවත් අරුත් කිහිපයක් නම්, 'පදනම' හා 'අප අභ්‍යන්තරයේ තිබෙන ශක්තිය' වේ. අපි නිතරම පවසන 'ආධ්‍යාත්මික දියුණුව ඇති කර ගැනීම' යනු, 'ඇදහිය නොහැකි අප අභ්‍යන්තරයේ තිබෙන ශක්තිය, හොඳින් දීප්තිමත් කරගෙන කටයුතු කිරීමය' සේ අරුත් ගැන්විය හැකිය.

එසේ වූ විට, සකුරා ගසෙහි කොළ වල පාට වෙනස්වී, හැලියාම යන ස්වභාවික ක්‍රියාව පවා ආධ්‍යාත්මික දියුණුව පිළිබඳ අපට කියාදෙන අත් පොතක් වේ. එසේම අපද අඛන්ඩව පැවතෙන නිර්මාණශීලීත්වය හා වෙනස්වීම් වලට භාජනය වන ස්වභාව ධර්මයේ එක් කොටසක් බැවින් 'ස්වභාව ධර්මයේ න්‍යායට අනුගතව ජීවත්වීමට' කටයුතු කිරීම ආධ්‍යාත්මික දියුණුව වේ. 'ආර්ය අෂ්ඨාංගික මර්ගයේ' සඳහන් වන 'යහපත් වීර්යය' ලෙස සඳහන් වන්නේ මෙම කරුණ වේ.

## ස්වකීය වූ තමාව හමුවීම

ගහ කොළ වලට වෙනස්ව, මනුෂ්‍යයන් වන අප ආත්මාර්ථකාමීත්වයෙන් කටයුතු කරන අවස්ථා තිබේ. මෙයට කැමතියි... මෙයට අකමැතියි..., මෙය හරිය... මෙය වැරදිය..., ලෙස තමා විසින් මිනුම් පනවාගනී. තම දෑස ඉදිරිපිට තිබෙන අවංකව භාර නොගන්නා අවස්ථාවන්ද තිබේ.

එවැනි අවස්ථාවල, යථාර්තයට අනුගතව කටයුතු කිරීමට විවිධ උපක්‍රමයන් භාවිතා කිරීම ‘ආධ්‍යාත්මික දියුණුව’ ඇති කර ගැනීම වේ. එම උපක්‍රමයන් තුලින් අවස්ථාවන්ට අනුකූලව ආධ්‍යාත්මික දියුණුව ඇති කර ගන්නා ආකාරය බුදුන් වහන්සේ නොයෙක් අයුරින් දේශනා කර ඇත.

එය කුඹුර සීසාන ගවයෙකුට උපමා කරන්නේ නම්,

වපුරන බීජය- ශ්‍රද්ධාවයි, පවතින වර්ෂාව- ශාරීරික හා මානසික පුහුණුවයි, නගුල- ප්‍රඥාවයි, ගොන් කරත්තය- ලැජ්ජාබයයි, බැදතබන කඹය- හදවතයි, රේක්කය- ආත්ම පරික්ෂාවයි, ආහාර පමණට ගැනීම- ශාරිරික හා වාචික ශික්ෂණයයි, වල් පැලෑටි ගැලවීම- සත්‍යය ආරක්ෂා කරගෙන ජීවත්වීමයි, ගවයන් බැදි පෝරුව- නම්‍යශීලිත්වයයි, ලෙස ‘හදවත හා මනස සංවර්ධනය කරමු’ යන ග්‍රන්ථයෙහි සදහන් වේ.

‘ලැජ්ජාබය’, ‘ආත්ම පරික්ෂාව’, ‘ශාරීරික හා මානසික පුහුණුවයි’, ‘සත්‍යය ආරක්ෂා කරගෙන ජීවත්වීමයි’, ‘නම්‍යශීලිත්වයයි’ යන ස්වරූපයන් තුලින්, ඉදහිට එබී බලන තම ආත්මාතකාමීත්වයේ හදවත ගැන ආත්ම පරික්ෂාවක්, පසු විපරමක් කර ස්වකීය වූ තමාව හමුවිය යුතුය. ඒ සෑම ක්‍රියාවක්ම අපහසුතාවයෙන් කිරීම නොව, තමනුත් අන්‍යයනුත් සැහැල්ලුවෙන් ආධ්‍යාත්මික දියුණුව වෙත ළඟාවීමට විවිධ උපක්‍රමයන් ගෙන් යුතුව වැඩ කිරීමය.

ටිකක් පරිස්සමින් විචක්ෂණශීලිව වචන භාවිතය තුලින් සාමකාමීත්වය උදවේ. නම්‍යශීලීව කටයුතු කිරීම තුලින් අන්‍යයන්ගේ හදවත මෘදු මොලොක් වේ. ආහාර ගනිද්දී වුවද ප්‍රමාණය ඉක්මවා නොගැනීම තුලින් ශරීරයට පහසුවක් දැනෙන බව අපි කවුරුත් අත්දැක තිබේ.

මීට පෙර වතාවකදී, කෝසෙයි මාසික සඟරාවේ ‘යහපත් වීර්යයේ හදවතින් එදිනෙද ජීවිතය ගත කිරිමේ අධිෂ්ඨානය’ යනුවෙන් පිලියක් පලවූ අවස්තාවක් තිබුනි. ‘අන්‍යයන් සතුටු වන දෑ කරමු’, ‘අන්‍යයන්ට ලෙන්ගතු කෙනෙකු වෙමු’, ‘තමාටම ලැජ්ජාවක් ඇති නොවන දෑ කරමු’, ‘අන්‍යයන්ට මෘදු හා කාරුණික වෙමු’, කිසිම විටෙක කේන්ති නොගන්නා පුද්ගලයෙකු වෙමු’.

මෙම කරුණු තමාටම ඇසෙන්නට සලස්වා, ඉදහිට තමා ගැන පසු විපරම් කර, බුද්ධ මාරගයේ ගමන් කිරීමේ සතුට මිමිනූහ. එම සතුට ආධ්‍යාත්මික දියුණුව තුලින් ස්වකීය වූ තමා හා හමුවීමේ සතුට යයි සිතමි. මෙම ස්වකීය තමා යනු අපගේ බුද්ධ ශක්තිය වේ.

From *Kosei*, October 2018



# මාගේ ජීවිතය වෙනස්කල ප්‍රායෝගික බුදු දහම

ප්‍රකාශ් කුමාර්
මධ්‍යම දිල්ලියේ හෝසා ශාකාව

මෙම කතාව 2018 වර්ෂයේ 6 වන මස 10 වන දින ගොමෙයිනිච් දවසේදී මධ්‍යම දිල්ලියේ හෝසා ශාකාවේදී පවත්වන ලද්දකි.

ඔබ සැමට සුභ දවසක් වේවා. මෙවන් වැදගත්වූ දවසක මේ අවස්ථාව ලබා දුන්නාට බොහොමත්ම ස්තූතියි.

මම ප්‍රකාශ් කුමාර්. මම ඉන්දියාවේ බිහාර් ප්‍රාන්තයේ, බාගල්පූර් නම් කුඩා නගරයේ පියා ජා සහ මව මිසර යන පවුලේ දෙවන පිරිමි දරුවා ලෙස උපත ලැබීය. මට අයියා කෙනෙකු සහ අක්කාලා දෙදෙනෙකු සිටී. පවුලේ බාලයා වූ මාව දෙමවුපියන් ඉතාමත් ආදරයෙන් රැකබලා ගත්තා, මමද ඔවුන්ට බෙහෙවින් ආදරය කරනවා.

මා පසුකරගෙන ආ ජීවිත ගමනේදී මාව ආදරයෙන් රැකබලාගත් සියළු දෙනාටම දුකේදීත් සැපේදීත් ලගින් සිටියාට හදවතින්ම ස්තූතිපූර්වක වනවා. මම දෙමවුපියන්ගේ සහ ආච්චී සීයාගේ ආදරය සෙනෙහස මැද හැදී වැඩින. රාත්‍රිය ලගාවන විට ආච්චී මට කතන්දර කියා දුන්නා. ඒ වුනත් ආච්චී හා සීයා අප අතරින් ඉක්මණින්ම වෙන්වී මෙලොවින් සමුගෙන ගියහ. ආදරය කරන කෙනෙකුගේ නික්මයාමේ ශෝකය අදටත් මතකයේ රැදී තිබේ. මාගේ හොදම මිතුරෙකුද මට අහිමිවිය. මරණයට හේතුව ඩෙංගු උණ වැළදීම වුනත්, තාත්තා නොමැති අසරණ දුප්පත්කම නිසා නිසි ප්‍රතිකාර ලබගැනීමට නොහැකියාව නිසාය. ඒ කාලයේ වයස 8ක් වූ මම කුමක් සිදුවී ඇද්දැයි නිසි වැටහීමක් නොමැතිව හුදකලා මානසිකත්වයකට පත්විය. (ඇයි මිනිසුන් මරණයට පත්වන්නේ?)(ඇයි දෙවියන් වහන්සේ දුකට පත්වූ අයට පිහිට නොවන්නේ?) (ඇයි මිනිසුන් ඊර්ෂියා කරන්නේ?)යැයි විවිධ දේ සිතෙන්නට වුනි.



මධ්‍යම දිල්ලියේ හෝසා ශාකාවේදී සෙප්පෝව පවත්වන ප්‍රකාශ් මහතා

නියමිත වේලාවට පාඩම් වැඩ ආදියේ නිරතවී සිටින විට එවන් ප්‍රශ්න අමතක විය. මම දක්ෂ සිසුවෙක් නොවුනත් ක්‍රීඩාව විවිධාකර නිසා ඇලුම්කමක් දැක්විය. ක්‍රිකට් සහ පිහිනීමට දක්ෂතාවයක් තිබින.

මාගේ පියා ඉක්මනින් තරහ ගැනීමේ චරිත ලක්ෂණ නිසා මිනිසුන්ට බනින රණ්ඩුකරන අවස්ථා කිහිපවිටම දැක ඇත. එම නිසා මම පියාට වැඩි කැමැත්තක් නොදැක්විය. තාත්තා විශාල හඩින් කතාකරන සෑම විටම අම්මාගේ සිත කලබල ගතියක් කළකිරුණු ස්භාවයක් දක්නට විය. එවිට මම (බය වෙන්න දෙයක් නෑ කවදහරි දවසක හොද දෙයක් වෙයි) කියා සිනාමුසු මුහුනින් අම්මාට පැවසීය.

එක දවසක්, තාත්තා හොදින් ඉන්නා වේලාවක (ඇයි ඔච්චරටම කේන්තිගන්නේ? අම්මත් මමත් මීට වඩා නිස්කලංකව ඉන්න කැමතියි, තාත්තගේ කේන්ති මුහුණ දුටු විට අම්මා අසනීප වෙනවා) කියා තත්තාට පැවසීය. එවිට තාත්තා (මින් පසු කේන්ති අරන් ඉන්නා මුහුණ පෙන්වන්නේ නැහැ) යැයි පිළිතුරු දුනි. දවසක් පාසල නිම වී ගෙදරට පැමිණෙන විට, තත්තා සුළු දෙයකට අම්මාට බැන වැදීම නිසා අඩමින් සිටින අම්මාව දුටුවා. එම අවස්ථාවේ කුමක් කලයුතුද යැයි නොදැන කරකියා ගතහැකි දෙයක් නොවීය.

අනෙක් පසින් තාත්තාගේ ගති ලක්ෂණ මාව දිරිමත් කරන පැත්තක්ද තිබින. කිසිම දෙයක් හරි ආකාරව සිදු නොවීම නිසා දුකින් සිටින විට (දුක් වෙන්න දෙයක් නෑ, කිරීමට නොහැකි කිසිම දෙයක් නැහැ, අනිවාර්යයෙන්ම පුතාට පුලුවන්) කියා පැවසීය. විටෙක එය වේදනා ගෙන දෙන කරුණක් වූ නමුත් තාත්තා කියූ ආකාරයට කරමින් පැමිණියා.

මම කුඩා කළ සිටම ආත්මාර්තකාමී ජීවිතයක් ගත කළා. සෑම විටම තමා ගැන විතරක් සිතමින්, යහළුවන්, නෑදෑයන්ගේ අදහස් ගැන නොසිතා මම හරි යැයි සිතමින් වැඩකලා. අන් අයගේ කතාබහ අසාසිටීමට ඉවසිලිවන්තකමක් නොවීය. සෑම විටම තමා මුළින්ම අදහස් ඉදිරිපත් කර කතා කිරීමට පටන් ගෙන අතරමැද තව කෙනෙකුගේ කතාවකට බාධා කරන අවස්ථාද තිබින. ඇත්තටම මම ආත්මාර්තකාමී අයෙකු විය.

මම විශ්ව විද්‍යාලයට ඇතුලත් වී උපාධිය ලබා ගැනීමට ඉගෙනගනිමින් සිටින කාලයේ සහෝදරියගේ විවාහයට යන වියදම තාත්තා එකතු කරන්නට ගත්තා. විවාහ උත්සවයට ප්‍රමාණවත් මුදල් නොමැති නිසා බැංකු ණයක් ලබාගැනීමට සිදු විය.

ගෙදර ආර්ථික තත්වය නරක අතට හැරීම නිසා, මම රැකියාවක් සොයා ගැනීමට බාගල්පූර් සිට දිල්ලියට පැමිණියා. එවිට මාගේ වයස 22කි. එහිදී ජීවිත් වීමට විවිධ දේ කරමින් අද්දැකීම් ලැබීය එය මාගේ ජීවිතයේ දෙවන ආරම්භයයි. රැකියාව වෙනත් ජීවන උපායක් නොමැති නිසා රැකියාව කරගෙන යාමට සිදුවිය. මම ඇගළුම් කර්මාන්ත ශාලාවක රැකියාවක් සොයාගෙන සේවා ස්ථානය පිළිබද අත්දැකීම් නොමැති නිසා සහායකයෙකු ලෙස රැකියාවේ නිරතවිය. ඒවාගෙම කණ්ඩායමක් ලෙස එකතුව වැඩ කිරීමට ඒ තුළින් අවබෝධයක් ලැබීය.

මාස කීපයකට පසු, රැකියාව වෙනස්කොට ව්‍යාපාර ක්‍රියාවලියට බාහිරව උදවු කරන රැකියාවකට ඇතුල් විය. එහෙත් මාසික ආදායම සෑහිමකට පත් නොවීය. තාත්තාගේ ණය මුදල ගැන සිතන නිසා හරි හැටි නින්දක් ද නොවීය. එම නිසා මම පූර්ණ කාලීන රැකියා දෙකක් කිරීමට සිතා සම්මුක පරීක්ෂනයට ගොස් රැකියාව ලබා ගත්තා. එම කාලයේ සිට මුදල් ඉතිරි කරමින් තාත්තාගේ ණය ගෙවීමට උදවු කිරීමට හැකියාව ලැබුනා. දෙමවුපියන්ට උදවු කිරීමට හැකියාව ලැබීම ගැන විශාල සතුටක් වනවා.

ඒ වුනත් ඒ කලයේ ජීවිතයේ අමාරු කාලයද වුනා. ජීවිතයෙ සතුට අත්විදීමට නොහැකිව (ඇයි ගෙදර වෙනුවෙන් ඇයි මම මෙචර කැපවෙලා වැඩ කරන්න ඕනේ)(අම්මා තාත්තා මොනවා හිතන් ඉන්නවාද) යැයි විවිධ දේ සිතට ගලා එන්නට වුනා. ආත්මාර්ථකාමී පුද්ගලයෙකු වූ මම තාත්තාට ගෞරව කලේ නැහැ. පසු කලෙක බුද්ධ ස්භාවය තේරුම් ගැනීමට හැකිවී, තාත්තා ඉක්මනින් කේන්ති ගන්නා පුද්ගලයෙකු වුවත්, පවුල වෙනුවෙන් බෙහෙවින් කැපවී වැඩ කරන ආකරය වටහා ගැනීමට හැකිවිය.

අවුරුද්දකට පසු, රැකියාව මාරුකොට ඉහල පාරිභෝගික සහායකයෙකු ලෙස පෞද්ගලික සමාගකම රැකියාවේ නිරතවිය. ඉන් අවුරුදු එකහමාරකට පසු නායකයෙකු ලෙස උසස්විය.

මම 2013 වර්ෂයේ 6 වන මස 12 වන දින රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයට ඇතුල්විය. රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයට මාව හදුන්වාදුන් අමිත් කුමාර් සාන්ට මම හදවතින්ම ස්තුතිපූර්වක වනවා. ශිම් හන්ද සාන්, බන්දි බාතොරා සාන්ව හමුවිය. මම මගේ අම්මා ඉන්නා ප්‍රදේශයේ සිට කිලෝමීටර 1500ක් පමණ දුරින් නමුත්, මේ වනතෙක් තනිවම ජීවත් වූයේ නැත. හන්ද සාන් සෑම අවස්ථාවකදීම තමන්ගේ පුතෙකුමෙන් රැකබලා ගත්තා. ඇය මාගේ ධර්ම ගුරුවරිය ලෙස ඉතාමත් ගෞරවකොට සලකමින් ස්තුතිවන්ත වනවා. ඒ වාගේම සාමාජිකයන්ගෙන් ලැබෙනා නොමද සහාය, මට කවදාවත්ම අමතක වන්නේ නැහැ. මම සියළු දෙනාටම හදවතිම ස්තුතිපූර්වක වනවා. එමෙන්ම මෙවන් හොද සාමජිකයන් පිරිසක් සමග පවුලක් ලෙස වැඩ කිරීමට හැකියාව ලැබුනේ රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානය නිසා සංවිධානයටද හදවතින්ම ස්තුතිවන්තවනවා.

සූත්‍ර සජ්ජායනය, හෝසා වැනිදේ ඉගෙන ගනිමින්, විශාල විශිෂ්ඨ ධර්මයන් ඉගෙනීමට හැකියාව ලැබුනා. සෑමවිටම සිනාමුසු මුහුණින් සුභ පතමින්, සෑම උදෑසනකම ස්තුතිපූර්වක හැගීම වචන වලින් කියමින්, සෑම දෙයම පිළිවෙලට සකස්කරමින්, මුලින්ම ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය. රිෂ්ෂෝ කෝසෙයිකායි සංවිධානයේ කියා දුන් දෙයක්නම් සෑම විටම හොද දෙයක් කරන්න, කිසි විටක අන්කෙනෙකුට කරදරයට පත්වන අපහසුතාවයට පත්නොවන විධියට වැඩ කරන්න යන්නයි. අන් අයගේ සතුට ප්‍රාර්ථනා කරමින් ජීවිතය වර්ධනය කර ගැනීමට කටයුතු කිරීමේ වැදගත්කම, එසේ කලවිට ඇත්තටම සතුටට පත්වීමට හැකියාව ලැබෙන බවට ඉගෙන ගත්තා. රැකියා ස්ථානයේ රැකියාවේ යෙදෙන සහායකයන්ට වේලාව තුල වැඩ ඉවර කිරීමට උදවු කිරීමට පටන්ගත්තා. සහායකයන් සිනාමුසු මුහුණින් ස්තුතිය පුදකල විට මට එය විශාල සතුටක් විය. ප්‍රධානියාගෙන්ද මාව ඇගයීමට ලක්විය.

වැදගත්කොට සලකන (සූත්‍ර සක්ඣායනය) (මිච්බිකි,තෙදොරි,හෝසා) (ධර්මය ඉගෙන ගැනීම) යන දේ, මගේ ජීවිතයේ විශාල හැරවුම් ලක්ෂයක් විය. ඒ වාගේම සූත්‍ර සක්ඣායනය සෑම දෙයකම දොරවල් විවෘත කිරීමට හැකියාව ඇති වටිනා යතුරක් බව අවබෝධ විය.

මෙම අවස්ථාවේදී දකුණු ආසියාවේ අන්තර්ජාතික මූලස්ථානයේ අධ්‍යක්ෂක මසතොෂි ශිමමුරා මහාතාට මාගේ හදවතින්ම ස්තුති පූර්වක වනවා.

අධ්‍යක්ෂක තුමන්ගේ දිරිගැන්වීමෙන් ආත්ම විශ්සාසය වැඩිවී, මාගේ හැකියාවන් හදුනා ගැනීමට හැකිවිය. එතුමාගෙන් ලැබුන උපදේශන, උදවු උපකාර වචන වලින් විස්තර කිරීමට නොහැකි තරම් විශාලය. එතුමාගේ ධර්ම උපදේශන වලට සවන් දෙමින්, තරුණ අවදියේදී කොපමණ දුෂ්කරතා වලට මුහුණ දෙමින් පැමිණියද, ඒ වාගේම නායකයන්ගේ උපදේශන පිළිපදිමින් රිෂ්ෂෝ කෝසෙයි කායි ඉගැන්වීම් තුළින්, ඒ ආකාරයට වැඩකරමින්, පවුල සතුටින් තියන ආකාරය

ඉගෙන ගනු ලැබුවා. ආශිර්වාදයෙන් මම මාගේ අරමුණ තේරුම් අරගෙන එයට යාමට කුමක් කල යුතුද යන්න වැටහින.

තායිලන්තයේ බැංකොක් වල පැවති සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර සම්මන්ත්‍රණයට සහභාගි වී අලුත් ධර්ම කරුණු රාශියක් ඉගෙනීමට හැකිවී පුදුමයට පත්විය. මට සම්මන්ත්‍රණය මෙහෙය වීම භාර විය. මම එය මහත් ගෞරවයෙන් භාරගතිමි. මෙහෙයවීම සිදුකල පළමු අවස්ථාව බැවින් බයට පත්විය. එවකට බැංකොක් ශාකාවේ ශාකා ප්‍රධානී තුමා (විශිෂ්ඨ ලෙස මෙහෙය වීම කලානෙ, ඔය විධියටම ඉදිරියට කරගෙන යන්න) යැයි මාව දිරිමත් කල එම වචන කිසිදක අමතක නොවේ. ඒ වාගේම ශ්‍රී ලංකාවේ ශාකා ප්‍රධානී තුමන්වත්, බංගලාදේශ ශාකාවේ ශාකා ප්‍රධානී තුමාටත් හදවතින්ම ස්තූතිවන්ත වනවා. ශාකා ප්‍රධානීන් තිදෙනාට මාගේ ගෞරවය ස්තූතිය පුදකර සිටිනවා. බුදුන් වහන්සේගේ ආශිර්වාදයෙන් අපට ලැබී ඇති ජීවිතය පිලිබද, ශාකා ප්‍රධානී තුමන්ලාගෙන් ඉගෙනීමට හැකියාව ලැබුනා. මට මෙවන් ධර්මයක් අවබෝධ කරගැනීමට හැකියාව ලැබුනේ ශාකා ප්‍රධානී තුමන්ලාගේ ඉගැන්වීමේ ක්‍රමවේදය ඉතාමත් විශිෂ්ඨ නිසාවෙනි.

සම්මන්ත්‍රණය අවසන්වූ විට, මම මගේ ප්‍රගතිය සහ මම ගමන් කරන මාර්ගය ගැන භාෂා පරිවර්ථකගෙන් විමසීය. එවිට ඔවුන් ඉතාමත් ප්‍රයෝජනවත් උපදේශයන් ලබාදුනි. පරිවර්ථන කටයුතු කරන සැමටත්, බැංකොක් ශකාවේ සහ ජපානයෙන් පැමිණි කාරයමණ්ඩලයේ සියළු දෙනාටමත්, දකුණු ආසියාවෙන් සහභාගි වූ සියළු දෙනාටමත්, සම්මන්ත්‍රණය තුළින් විශිෂ්ඨ ධර්මයක් ලබා ගත් සාමජිකයන් සියළු දෙනාටමත් හදවතින්ම ස්තූතිවන්ත වනවා. සැමගේම ශක්තියෙන් උපකාරයෙන් ඉතාමත් විශිෂ්ඨ සම්මන්ත්‍රණයක් බවට පත්විය.

බුද්ධ ස්භාවය පිළිබද කියාදෙන සම්මන්ත්‍රණයට සහභාගි වී සිටින විට තාත්තා හා තිබුන බැදීම හා අතීතයේ දේ සිහිපත් වන්නට වුනා.

සම්මන්ත්‍රණය හොදින් අවසන්වී දිල්ලිය බලා ආපසු යනවිට, තාත්තා අසනීප තත්වයට පත්ව ඇතැයි දුරකථන ඇමතුමක් ලැබුනා. මම ඉක්මනින් තාත්තා බැලීමට ගියා. තාත්තා ඉතාමත් සතුටින් විවිධ දේ කතාකරන්නට වුනා. තාත්තාගේ කතාවට බාධා නොකොට අසා සිටියා. ඉන්පසු (මම තාත්තා ළගම ඉන්නවා. තාත්තාට ඉක්මනින්ම සනීප වෙනවා) යැයි පැවසීය. එසේ කලවිට පුදුමයට කරුණ නම් එම දවසේ සිට සුවපත් අතට හැරීමයි. මම තාත්තාගේ (හැමවෙලෙම ලගින් සිටින නිසා තරහා නොගන්නා හදවතක් ඇතිකර ගනිමින් සතුටින් ගත කරන්න) යැයි ඉල්ලා සිටියා. ඉන්පසු එවකට දිල්ලි ශාකාවේ නායකයාට දුරකතනයෙන් කතා කොට, ටික කාලයක් තාත්තා සමග සිටින නිසා ඉදිරියට පැවැත්වෙන සම්මන්ත්‍රණ සදහා සහභාගි වීමට නොහැකි යැයි පවසා සිටියා. නායකයාද එය හොදින් තේරුම් ගෙන(දෙමවුපියන්ව හොදින් රැක බලා ගැනීම බෝධිසත්ව ගුණාංගය පුරුදු පුහුණු කිරීමක්.අපිත් තාත්තාට ඉක්මන් සුවය ප්‍රාර්තනා කරනවා යැයි පැවසීය. ඒ දවසේ සිට පියාද වෙනස් වී නිහත්මානී ලෙස ජීවත් වීමට පටන් ගත්තා.

මම යහළුවන්ටද මෙම විශිෂ්ඨ ධර්මය කියා දෙමින්, දුකට පත්වූ අයව දුකින් මුදවා ගැනීමට කටයුතු කලා. මම නික්යෝ නිවානෝ තුමාගේ ඉගැන්වීම් සහ නිච්කෝ නිවානෝ තුමාගේ ඉගැන්වීම් ප්‍රායෝගිකව පුරුදු පුහුණු කරමින් සිටිනවා. මේ වනවිට විශාල ප්‍රමානයකට ධර්මය කියාදී, ඒ අතරින් කිහිප පිරිසක් සාමාජිකත්වයද ලබා සිටිනවා. රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ සංවර්ධනය තවදුරටත් ප්‍රාර්ථනා කරමින්, ධර්ම ප්‍රචාරන කටයුතු මින් ඉදිරියටත් කරගෙන යාමට බලාපොරොත්තු වනවා.

මම දැන් රිෂ්ෂෝ කෝසෙයි කායි කාර්යය මණ්ඩලයේ සිටින එකට හදවතින්ම ස්තූතිවන්ත වනවා. සේවා කාර්යය මණ්ඩලයට පත්වූ පසු සුමොන් බරුවා මහතාව හමුවිය. ඔහුගේ නිහත්මානී ගතිගුණ වලට මම බෙහෙවින්ම ගෞරව කරනවා. ඔහුගෙන් ඉතා වටිනා උපදේශයන් ලබාගෙන, උදවු උපකාරද ලබා ගනිමින්, නිවරදි ගමන් මාර්ගයේ ගමන් කරමින් සිටිනවා. එවන් බුද්ධිමත් කෙනෙකු සැමදම වැඩ කිරීමට හැකි වීම ඉතාමත් වටිනා දෙයක් ලෙස සිතනවා. සුමොන් සාන් ගේ නිහත්මානීත්වයත්, කරුණාවත් මට කවදවත් අමතක වන්නේ නැහැ.

ජීවිතයේ ඉතාමත් වටිනාම අරමුණ අන් අයව දුකින් මුදවා ගැනීමයි. ඒ වාගේම සතුට යනු තමා සහ අන් කෙනා යන දෙකොටසම සතුටට පත්වීමයි. රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානය අපව බුදුන් වහන්සේ ලගට යාමට නිවරදි මාර්ගය කියා දෙනවා. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර සම්මන්ත්‍රණයෙන් බුද්ධ ස්භාවය පිළිබද ඉගෙන ගත්තා. බුද්ධ ස්වභාවය සැම කෙනෙකු තුළම ඇති බවත් එය තමා තුළ ඇති බවද, අන් අය තුළද තිබෙන බව තේරුම් ගෙන එයට ගෞරව කරමින් කටයුතු කිරීම ඉතාම වැදගත්ය.

මෙම වර්ෂයේ 3 වන මස 5 වන දින දයිසේදෝවේදී රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ 80 වන සංවත්සරය උත්සවයට සහභාගි වීමට හැකිවිය. නිච්කෝ නිවානෝ තුමාගේ ධර්ම උපදේශන වලට සවන්දී හදවත

ඉතාමත් සතුටට පත් විය. එය ඉතාමත් ස්තූතිපූර්වක කරුනකි. මගේ සිහිනයක්ව තිබූ නික්යෝ නිවානෝ තුමා උපන් සුගනුමා ගමට යාමටයි එය මේ තරම් ඉක්මනින් පුළුවන් වේ යැයි සිතාසිටියේ  නැහැ. සුගනුමා ප්‍රදේශය ඉතාමත් නිස්කලංක අසිරිමත් පෙදෙසක් විය. එම ශාකාවේ ප්‍රධානී තුමන් නික්යෝ නිවානෝ තුමා උපන් ස්ථානය, පාසල් ගිය ස්ථානය, ඒ වාගේම පාසල් යන අතරමග වන්ද්නාමාන කළ දේවාල ආදිය පෙන්වා දුන්නා. ඒ වාගේම කුඩාකල පිහිනමින් විනෝද වූ වැවත් දැක ගැනීමට හැකිවුනා.

මේ ලෝකවාසී සියළු දෙනාම සතුටට ගෙනයන ධර්මය අවබෝධ කරන සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ඉගෙනීමට පෙර සිටම නික්යෝ නිවානෝ තුමා ධර්ම මාර්ගයේ ගමන්ගත් බව ඒ තුළින් අවබෝධ විය.

මාගේ ජීවිතයේ සෑම අවස්ථාවකම මට උදවු උපකර කල සාමජිකයන් සියළු දෙනාටම හදවතින්ම ස්තූති පූර්වක වනවා. 100 වන සංවත්සරය වනතෙක් ඇති ඉදිරි අවුරුදු 20 ක කාලය සාමාජිකයන් සියළු දෙනා සමග එකතුව ධර්ම ප්‍රචාරන කටයුතු උපරිම ශක්තියෙන් කිරිමට බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම මා සිටින ප්‍රදේශයේ තවතවත් ධර්මය ව්‍යප්ත කිරීමට කටයුතු කරමි.

බුදුරජාණන් වහන්සේටත්,
නික්යෝ නිවානෝ තුමාටත්,
නිච්කෝ නිවානෝ තුමාටත්,
හදවතින්ම ස්තූතිවන්ත වනවා.
සියළු දෙනාටම බොහොමත්ම ස්තූතියි.



2017 වසරේ තරුණ සම්මන්ත්‍රණයට සහභාගී වු පිරිස සමඟ
(වම් පස කෙළවරේ)

# සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සාරාංශය හා වැදගත් කරුණු

## සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය
## උපාය කෞශල්‍යය, 2 වන පරිච්ඡේදය

මෙම පරිච්ඡේදය 'තථාගතයන් වහන්සේගේ සදතන ජීවිතය පිළිබඳ විවරණය, 16 වන පරිච්ඡේදය' සමඟ සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ හරය ලෙස අතීතයේ සිට පිළිගනී. එපමනටම වැදගත් වන්නේ මන්ද, ඒ ගැනත් අවධානය යොමු කරමින් මෙම පරිච්ඡේදය අධ්‍යයන කරමු.

සමාධිගතව සිටි බුදුන් වහන්සේ ධ්‍යානයෙන් නැගී සිට මෙසේ අමතන්නාහ. 'බුදුන් වහන්සේගේ ඥනය ඉතා ගැඹුරුය, මෙම විශ්වයේ පදනම වූ සත්‍යය අවබෝධ කර තිබේ'. නමුදු 'එම සත්‍යය ඉතා ගැඹුරු නිසා සාමාන්‍ය පුද්ගලයන්ට අවබෝධ කර ගැනීමට නොහැකිය. එබැවින් විවිධ වූ මාර්ග සහ විවිධ වූ උපමා කථා යොදා ගනිමින් ධර්මය දේශනා කලහ. ඒ තුලින් මනුෂ්‍යයන්ට දුකින් මිදීමට හැකියාව ලැබුණද, එහි අභ්‍යයන්තර අභිප්‍රාය කවුරුත් දැන සිටියේ නැත' ලෙස අවධාරණය කලහ.

## දස ධර්මතාවන් හා
## එක් ප්‍රාර්ථනයක් ලෝක තුන්දහකට බලපෑම

මේ කරුණු දේශනා කල බුදුන් වහන්සේ නිහඩ විය. මඳ වේලාවකට පසුව නැවතත් මෙසේ වදාලහ.


''ශාරිපුත්‍රයනි, මම සවිස්තරව පහැදිලි කලද ඒ ගැන අවබෝධ නොවන නිසා දේශනය නොකරමි. මන්ද යත් මම අවබෝධ කර ගත් ධර්මය තේරුම් ගත හැකි වන්නේ තවත් බුදුවරයෙකුටම පමණයි. ඒ මේ ලෝකයේ සියළුම සිදුවීමකටම, සත්‍යය වූ ස්වරූපයක්, සත්‍යය වූ ලක්ෂණයන්, සත්‍යය වූ රූපකායක්, සත්‍යය වූ ශක්‍යතාවක්, සත්‍යය වූ ක්‍රියාකාරිත්වයක්, සත්‍යය වූ හේතුවක්, සත්‍යය වූ ප්‍රත්‍යයන්, සත්‍යය වූ ඵලයන්, සත්‍යය වූ බලපෑම, සත්‍යය වූ සම්පූර්ණත්වයක් තිබෙන'' නිසාය.

එය සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ අන්තර්ගත වන දස ධර්මතාවයන් වේ. 'සෑම සියළුදෙයකම යථා ස්වරූපය' සරළව එහි දක්වේ. මෙම කියාදීමට අනුකූලව අපගේ ජීවිතය හැරී බලද්දි පහත ආකාරයට දැක්විය හැකිය.

පළමුව මනුෂ්‍යයන් වූ අපට ආවේණික වූ ගති ලක්ෂණ තිබේ. එනම් හුරු පුරුදු වූ ස්වරූපයක්, ගති ලක්ෂණ හා රූප කායක් තිබේ. එසේම එම ස්වරූපය, ගති ලක්ෂණ හා රූප කායට ගැලපෙන ආකාරයට හැකියාවක් හා ක්‍රියාකාරීත්වයක් තිබේ. නමුත් මෙම කරුණු ස්ථාවර, වෙනස් නොවන දේවල් නොවේ. නොයෙකුත් තත්වයන්ට අනුකූලව ප්‍රවාහයට ලක්ව වෙනස් වේ.

එසේ නම් අපි, අපගේ ගති ලක්ෂණ 'වෙනස් වීමට ලක් නොවේ' ලෙස සිතුවිලි වල එල්බගෙන සිටින නමුත්, 'එසේ නොවේ. හේතුවට හා ප්‍රත්‍යයන්ට අනුකූලව, ප්‍රථිපලය හා එහි බලපෑම ඇතිවේ. එබැවින් ගති ලක්ෂණද වෙනස් කල හැකි දෑ වේ' යනුවෙන් මෙම දස ධර්මතාවන් වල කියා දේ.

මනුෂ්‍යයන් තුල සත්‍යය වූ ධර්මය අවබෝධ කර ගැනීමට පුළුවන් හැකියාව හා සහජතාවන් ඇත. එසේම නිරයට වැටීමේ හැකියාව හා සහජතාවයද ඇත. මෙම කරුණ තෙන්දයි දයිෂි විසින් තවත් විග්‍රහ කර දුන්නේ, 'එක් ප්‍රාර්ථනයක් ලෝක 3000 කට කරන බලපෑම' යන කියාදීමෙනි. මනුෂ්‍යයන්ගේ හදවත් පවත්වා ගන්නා එක් ආකාරයක් තුලින් ලෝක 3000 ක් (සෑම සියළු ලෝකයක්ම) වෙනස්වීමට භාජනය වේ. එම නිසා මෙම ''දස ධර්මතාව'' හා ''එක් ප්‍රාර්ථනයක් ලෝක 3000 කට කරන බලපෑම'' යන කරුණු අවබෝධ කර ගන්නේ නම්, 'දෛවය වෙනස් කිරීමට නොහැකිය' ලෙස සිතාගෙන සිටියා වුවද තමාව වෙනස්කරගෙන ධර්මාවබෝධය තුලින් බුදුබව සාක්ෂාත් කරගැනීමට හැකි බව පැහැදිලි වේ. ඊට එහා ඉමහත් වූ



දෙයක් නොමැත. අපගේ ජීවිතය හාත්පසින්ම වෙනස්ව, දීප්තියෙන් බැබළී 'මේ ආකාරයටම කරමු' යන තීරණය නොගෙන සිටිය නොහැකි වේ. එම නිසා අතීතයේ සිට 'දස ධර්මතාවන්' කියාදීම 'සංක්ෂිප්ත සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ලෙස හඳුන්වන්නට ඇත්තේ.

නමුත් මෙම 'දස ධර්මතාව' බුදුන් වහන්සේ දේශනා කළ සැනින්, මෙම කියාදීම් තම ජීවිතයට බද්ධ කර ගත යුතුය යන හැඟීම නොතිබිණි. එබැවින් එහි සිටි පිරිස මෙම කරුණ තේරුම් ගැනීමට අසීරුව ව්‍යාකූලත්වයට පත්විය.

බුදුන්වහන්සේ මෙතෙක් දේශනා කළ උපාය කෞශල්‍යය කියාදීම්ද බුදුන් වහන්සේගේ ප්‍රඥව තුලින් කල දේශනා ලෙස පවසමින් උපාය කෞශල්‍යයේ වැදගත්කම පෙන්වා දුන්හ.

එයින් තව තවත් තේරුම් ගැනීමට අපහසු විය. එක් අතකින් බුදුන් වහන්සේ අවබෝධ කරගත් ශ්‍රේෂ්ඨ වූ ධර්මය දේශනා කරාවි යැයි බලාපොරොත්තු වූවත් අනික් පසින් උපාය කෞශල්‍යය ගැන වර්ණනා කරනවා. මේ 2 ක අතර කුමනාකාර බැඳීමක් තිබේද? මනස තව තවත් ව්‍යාකූලත්වයට පත් විය.

## තෙවරක් ප්‍රතික්ෂේප කිරීම හා තෙවරක් ඉල්ලීම

අනතුරුව ශාරිපුත්‍ර තෙරුණ් වහන්සේ ඒ ගැන විමසූහ. එවිට බුදුන් වහන්සේ 'ඒ ගැන පැහැදිලි කිරීමට ගියහොත්, තවත් තේරුම් ගැනීමට අසීරු විය හැකිය', ලෙස පිළිතුරු දුන්හ. එවිට ශාරිපුත්‍ර තෙරුණ් 3 වරක් ප්‍රතික්ෂේප වී තිබුණත් නැවත වතාවක් ඉල්ලීමක් කලහ.

බුදුන් වහන්සේද මෙම කරුණ පැහැදිලි කර දිය යුතුය ලෙස සිටියහ. එබැවින් කවුරුත් ප්‍රශ්න අසන්නට පෙර ධර්ම දේශනය ආරම්භ කලහ. ඒ ආකාරයට කලේ, මනුෂ්‍යයන් හොඳින් මෙයට සවන් දිය යුතුය යන හැඟීම නිසාය. එහිදී ශාරිපුත්‍ර තෙරුණ් මහත් වූ උද්යෝගයෙන් සවන් දෙන්නට උවමනාවක් තිබෙන බව හැඟුන නිසා ධර්ම දේශනාව ආරම්භ කලහ.

## 5000 පිරිසක් ඉවත්ව යාම

එවිට සැනෙකින් අසුන් ගෙන සිටි 5000 ක පිරිසක් නැගිට ඉවත්ව ගියහ. ඔවුන්ව නැවැත්වීමට උත්සහ නොගත් බුදුන් වහන්සේ ඒ දෙස බලාගෙන සිටියා පමණි. ඔවුන් සියළුදෙනා ධර්ම මණ්ඩපයෙන් පිටත්ව ගිය පසු, නැවතත් බුදුන් වහන්සේ ධර්ම දේශනාව ආරම්භ කලහ.

## බුදුන් වහන්සේ මෙලොවට පහලවූ හේතුව

''බුදුන් වහන්සේ එකම එක ප්‍රාර්ථනයක් වෙනුවෙන් මොලොවට පහල වේ. එය නම්, සෑම සියළුදෙයකම සත්‍ය වූ ස්වරූපය ග්‍රහණය කරගෙන සිටින තථාගතයන් වහන්සේගේ ප්‍රාඥව හා දර්ශනය විවර කර- සුපිරිසිදු හදවතකින් යුතු ප්‍රාර්ථනය ඇති කිරීම (ඇතුළුවීම), , එසේම සීමාවන් නොමැති මහත් විශාල වූ තථාගතයන් වහන්සේගේ ප්‍රාඥව හා දර්ශනය පෙන්වීමට (පෙන්වා), තථාගතයන් වහන්සේගේ ප්‍රාඥව හා දර්ශනය සෑම සියළුදනාටම අවබෝධ කර දීමේ ප්‍රාර්ථනය (අවබෝධ කර දීම). තථාගතයන් වහන්සේගේ ප්‍රඥව හා දර්ශනය ළඟා කර ගැනීමේ මාර්ගයට සෑම සියළු පුද්ගලයෙකුටම මඟ පෙන්වීමට (ඇතුළුවීම කැමැත්ත ඇති කිරීම)ටය. නොයෙකුත් බුදුන් වහන්සේලා මෙම එකම එක කරුණ ප්‍රාර්ථනයේ තබාගෙන මෙලොවට පහල වුනි. ''

ඒ ආකාරයට බුදුන් වහන්සේලා මෙලොවට පහල වීමේ හේතුව ප්‍රථම වතාවට පැහැදිලි කර දුන්හ.

## සත්‍ය වූ විමුක්තිය ලබා ගැනීමට හැකි වන්නේ බුද්ධ යානයෙන්ම පමණි

තවද, සත්‍ය වූ විමුක්තිය ලබා ගැනීමට හැකි වන්නේ බුද්ධ යානයෙන්ම පමණි. 'ශ්‍රාවක, ප්‍රත්‍යයක බුද්ධ, බෝධිසත්ව යානා 3 න විවර කර ඒකයාන වූ බුදු බව සාක්ෂාත් කල හැකිය' ලෙස බුදුන් වහන්සේ වදාලහ.

''අවසන් නිර්නායකය නම්, නොයෙකුත් බුදුන් වහන්සේලා, සෑමවිටම බෝධිසත්වයන්ට ධර්ම මාර්ගය පෙන්වූහ, විවිධාකාරයෙන් ධර්මය දේශනා කලහ, සෑම සියළු දෙයකම යථා ස්වභාවය අවබෝධ කර ගැනීම සඳහා බුදුන් වහන්සේගේ ප්‍රඥව, සියළු සත්වයන්ට අවබෝධ කරදීම සඳහාය. එම එකම එක ප්‍රාර්ථනය හැර අන් කිසිවක් නැත. තථාගතයන් වහන්සේ 'සියලුම පුද්ගලයන්ට සමානාත්මතාවයෙන් යුතුව බුද්ධ මාර්ගයට මඟ පෙන්වීම' යන එකම එක ප්‍රාර්ථනය වෙනුවෙන් සියළු සත්වයන්ට ධර්මය දේශනා කලහ. සත්‍යය එයයි. දෙවෙනි හෝ තුන්වෙනි වශයෙන් යානා නැත. ඇත්තේ එකම එක බුද්ධ යානය පමණි''

''මම මීට පෙර 'ඔබ සියළුදෙනාට අනිවාර්යයෙන්ම බුදු බව ලබා ගත හැකිය' ලෙස දේශනා කර නැත. එසේ කලේ නියම කාලය නොවන බැවිනි. දැන් ඒ මොහොත උදාවී ඇත. එබැවින් ශ්‍රේෂ්ඨ වූ මහා ධර්මය දේශනා කරමි''

''මම දේශනා කල විවිධාකාර උපාය කෞශල්‍යයන් මනුෂ්‍යයන්ට ගැලපෙන ආකාරයට දේශනා කලහ. එය


ධර්මයට ඇතුළුවීමේ මූලික කියාදීම් වූහ. හදවත පිරිසිදුව නම්‍යශීලීව. සත්‍යය වූ ධර්මයට අවංකවෙමින්, බුදුන් වහන්සේ දේශනා කරන ධර්මය පිළිපදින විශාල පිරිසක් සිටින වර්තමාන කාලයේ, ඒ සියළුදෙනා වෙනුවෙන් මහා ධර්මය දේශනා කරමි.''

''උදාහරණයක් ලෙස, සමහර පුද්ගලයන් ස්තූප වන්දනාවේ යෙදුනද, නමෝ බුද්ධාය ලෙස පමණක් පැවසුවද, දරුවන් විසින් ගසක කදෙහි බුද්ධ රූපයක් ඇන්දද, ඒ සියළුදෙයම 'බුද්ධ මාර්ගයට ඇතුළුවීම' හා සැබැදෙයි. එසේ ඉතා සුළු කරුණු වුවද ''ශ්‍රේෂ්ඨ වූ බුද්ධ මාර්ගයට' යාවෙයි. එබැවින් උපාය කෞෂල්‍යය පහත්කොට නොසැලකිය යුතුය. 'උපාය කෞෂල්‍ය යනු සත්‍යය' බව අමතක නොකල යුතුය.''

''තව දුරටත් පවසනවා නම්, මේ දක්වා සත්‍යය වූ ධර්මයට අනුකූලව ධර්මය දේශනා කරමින් කටයුතු කලහ. අවංකවම ඒ සියළු දෙයට සවන් දී, පිරිසිදු හදවතට පත්ව සිටින ඔබ සියළුදෙනා, පැහැදිලිවම 'බුද්ධ මාර්ගයේ' ගමන් කරන අය වේ. සියළුදෙනාම බෝධිසත්වයන් වේ. එම යථාර්තය අවබෝධ කරගෙන, එහි සතුට අත්විදින්නේ නම්, ඔබ සියළුදෙනාටම අනාගතයේදී අනිවාර්යයෙන්ම බුදු බවට පත්වීමට හැකි වන්නේය.''

එසේ වදාලමින් මෙම පරිච්ඡේදය අවසන් වේ.





මේ මස සිට නික්යෝ නිවානෝ තුමා විසින් රචිත 『සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ සාරාංශය හා වැදගත් කරුණු』
කෝසේයි මුද්‍රණ ආයතනයේ ප්‍රකාශනයකි. 2016, P33—P42)





## ස්වකීය වූ තමාව හමුවීමට ආධ්‍යාත්මික දියුණුව ඇති කර ගැනීම

ඔක්තොම්බර් මාසය උදාවන විට මතකයට නැගෙන්නේ ක්‍රීඩා උත්සව, සාහිත්‍ය උත්සව, අර්තාපල් හා මීදී වල එලදාව ලැබෙන කාලය හා හැලෝවීන් වේ. නමුත් කෝසෙයි සංවිධානයේ සාමාජිකයන් ලෙස ඔඑශිකි පෙරහැර හා නිර්මාතෘ තුමා උපන් ගමේ පෙරහැර කලින්ම මතකයට නැගෙන පිරිසත් විශාල යයි සිතමි. එසේම මෙම වසරේ පැවත්වෙන තවත් උත්සවයක් නම් අමෙරිකාවේ ශාන්ත අන්තෝනියෝ ප්‍රදේශයේ තිබෙන ධර්ම ශාඛාවේ නව බුද්ධ මන්දීරය විවෘත කිරීමේ උත්සවය පැවැත්වීමද සතුටට කරුණකි.

නමුත්, මුලිකවම වන්නේ 'නිර්මාතෘ තුමාගේ අනුස්මරණ දිනයයි' නිචිකෝ නිවානෝ තුමා විසින් නිර්මාතෘ තුමාගේ ආදාහන උත්සවයේදී, නිර්මාතෘ තුමාද බුදුන් වහන්සේ හා සමාන ප්‍ර ාර්ථනයක් ඇතිව ඒ හා සමාන ජීවිතයක් ජීවිතයක් ගත කල බව සඳහන් කලහ. ඒ අප සංවිධානය ස්තාපිත කිරීමේ ප්‍රාර්ථනයද වන ' එක් කෙනෙකු හෝ විශාල පිරිසක් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කියාදෙන ජීවන ගමන් මඟ දැනගෙන, නියම සතුට තමාගේ ජිවිතයට බද්ධ කර ගත යුතුය'යන්නයි.

මේ මාසය නිර්මාතෘ තුමාගේ එම හදවතේ හැඟීම තමාගේ බවට පත් කරගෙන, තමාගේ නියම 'බුද්ධ ශක්තිය' හමුවෙන ආකාරයට සැහැල්ලුවෙන් ආධ්‍යාත්මික දියුණුව ඇති කර ගැනීමට අධිෂ්ඨාන කර ගනිමු.

රි.කෝ.කා. අන්තර්ජාතික මූලස්ථාන ප්‍රධානී
කෝයිචි සයිතෝ මහතා




RISSHO KOSEI-KAI INTERNATIONAL BRANCHES

**We welcome comments on our newsletter *Living the Lotus*:** living.the.lotus.rk-international@kosei-kai.or.jp

# Rissho Kosei-kai
# Overseas Dharma Centers 2018

**Rissho Kosei-kai International**
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo, Japan
*Tel:* 81-3-5341-1124 *Fax:* 81-3-5341-1224

**Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First Street Suite #1 Los Angeles CA 90033 U.S.A
*Tel:* 1-323-262-4430 *Fax:* 1-323-262-4437
*e-mail:* info@rkina.org http://www.rkina.org

**Branch under RKINA**

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way,
WA 98003 U.S.A.
*Tel:* 1-253-945-0024 *Fax:* 1-253-945-0261
e-mail: rkseattlewashington@gmail.com
http://buddhistlearningcenter.org/

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
6083 Babcock Road, San Antonio, TX 78240, U.S.A.
P.O. Box 692148, San Antonio, TX78269, USA
*Tel:* 1-210-561-7991 *Fax:* 1-210-696-7745
*e-mail:* dharmasanantonio@gmail.com
http://www.rkina.org/sanantonio.html

**Rissho Kosei-kai of Tampa Bay**
2470 Nursery Road, Clearwater, FL 33764, U.S.A.
*Tel*: (727) 560-2927 *e-mail*: rktampabay@yahoo.com
http://www.buddhismtampabay.org/

**Rissho Kosei-kai of Vancouver**

**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, U.S.A.
*Tel:* 1-808-455-3212 *Fax:* 1-808-455-4633
*e-mail:* info@rkhawaii.org http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1817 Nani Street, Wailuku, HI 96793, U.S.A.
*Tel:* 1-808-242-6175 *Fax:* 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona,
HI 96740 U.S.A.
*Tel:* 1-808-325-0015 *Fax:* 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, U.S.A.
*Tel:* 1-323-269-4741 *Fax:* 1-323-269-4567
*e-mail:* rk-la@sbcglobal.net http://www.rkina.org/losangeles.html

**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
1031 Valencia Way, Pacifica, CA 94044, U.S.A.
*Tel:* 1-650-359-6951
*e-mail:* info@rksf.org http://www.rksf.org

**Rissho Kosei-kai of Sacramento**
**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016 U.S.A.
*Tel:* 1-212-867-5677 *Fax:* 1-212-697-6499
*e-mail:* rkny39@gmail.com http://rk-ny.org/

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056 U.S.A.
*Tel :* 1-773-842-5654 *e-mail:* murakami4838@aol.com
http://home.earthlink.net/~rkchi/

**Rissho Kosei-kai of Fort Myers**
http://www.rkftmyersbuddhism.org/

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
2745 N.W. 40th Street, Oklahoma City, OK 73112 U.S.A.
*Tel & Fax:* 1-405-943-5030
*e-mail:* rkokdc@gmail.com http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai, Dharma Center of Denver**
1255 Galapago Street, #809 Denver, CO 80204 U.S.A.
*Tel:* 1-303-446-0792

**Rissho Kosei-kai Dharma Center of Dayton**
425 Patterson Road, Dayton, OH 45419 U.S.A.
http://www.rkina-dayton.com/

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP,
CEP 04116-060 Brasil
*Tel:* 55-11-5549-4446 / 55-11-5573-8377
*Fax:* 55-11-5549-4304
*e-mail:* risho@terra.com.br http://www.rkk.org.br

**Risho Kossei-kai de Mogi das Cruzes**
Av. Ipiranga 1575-Ap 1, Mogi das Cruzes-SP,
CEP 08730-000 Brasil
*Tel:* 55-11-5549-4446 / 55-11-5573-8377

**Rissho Kosei-kai of Taipei**
4F, No. 10 Hengyang Road, Jhongjheng District,
Taipei City 100 Taiwan
*Tel:* 886-2-2381-1632 *Fax:* 886-2-2331-3433
http://kosei-kai.blogspot.com/

**Rissho Kosei-kai of Tainan**
No. 45, Chongming 23rd Street, East District,
Tainan City 701 Taiwan
*Tel:* 886-6-289-1478 *Fax:* 886-6-289-1488

**Korean Rissho Kosei-kai**
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
*Tel:* 82-2-796-5571 *Fax:* 82-2-796-1696
*e-mail:* krkk1125@hotmail.com

**Korean Rissho Kosei-kai of Busan**
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
*Tel:* 82-51-643-5571 *Fax:* 82-51-643-5572

**Branches under the Headquarters**

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road,
North Point, Hong Kong, Republic of China

**Rissho Kosei-kai of Ulaanbaatar**
15F Express tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
*Tel:* 976-70006960 *e-mail:* rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Sakhalin**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk
693005, Russian Federation
*Tel & Fax:* 7-4242-77-05-14

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29-00184 Roma, Italia
*Tel & Fax :* 39-06-48913949 *e-mail:* roma@rk-euro.org

**Rissho Kosei-kai of the UK**
**Rissho Kosei-kai of Venezia**
**Rissho Kosei-kai of Paris**

**International Buddhist Congregation (IBC)**
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo, Japan
*Tel:* 81-3-5341-1230 *Fax:* 81-3-5341-1224
*e-mail:* ibcrk@kosei-kai.or.jp http://www.ibc-rk.org/

**Rissho Kosei-kai of South Asia Division**
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang
Bangkok 10310, Thailand
*Tel*: 66-2-716-8141 *Fax*: 66-2-716-8218

**Rissho Kosei-kai International of South Asia (RKISA)**
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang
Bangkok 10310, Thailand
*Tel*: 66-2-716-8141 *Fax*: 66-2-716-8218
*e-mail*: thairissho@csloxinfo.com

**Branches under the South Asia Division**

**Rissho Kosei-kai of Delhi**
77 Basement D.D.A. Site No. 1, New Rajinder Nagar, New Delhi
110060, India

**Rissho Kosei-kai of Kolkata**
E-243 B. P. Township, P. O. Panchasayar, Kolkata 700094, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059,
West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya**
Ambedkar Nagar, West Police Line Road
Rumpur, Gaya-823001, Bihar, India

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsilhel, Sancepa-1, Lalitpur,
Kathmandu, Nepal

**Rissho Kosei-kai of Phnom Penh**
#201E2, St 128, Sangkat Mittapheap, Khan 7 Makara,
Phnom Penh, Cambodia

**Rissho Kosei-kai of Patna**
**Rissho Kosei-kai of Singapore**

**Thai Rissho Friendship Foundation**
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang
Bangkok 10310, Thailand
*Tel:* 66-2-716-8141 *Fax:* 66-2-716-8218 *e-mail:* info.thairissho@gmail.com

**Rissho Kosei-kai of Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
*Tel & Fax:* 880-31-626575

**Rissho Kosei-kai of Dhaka**
House#408/8, Road#7(West), D.O.H.S Baridhara,
Dhaka Cant.-1206, Bangladesh
*Tel:* 880-2-8413855

**Rissho Kosei-kai of Mayani**
Mayani(Barua Para), Post Office: Abutorab, Police Station: Mirshari,
District: Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Patiya**
Patiya, sadar, Patiya, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Domdama**
Domdama, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Cox's Bazar**
Ume Burmese Market, Main Road Teck Para, Cox'sbazar, Bangladesh

**Rissho Kosei-kai of Satbaria**
Satbaria, Hajirpara, Chandanish, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Laksham**
Dupchar (West Para), Bhora Jatgat pur, Laksham, Comilla,
Bangladesh

**Rissho Kosei-kai of Raozan**
West Raozan, Ramjan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Chendirpuni**
Chendirpuni, Adhunagor, Lohagara, Chittagong, Bangladesh

**Rissho Kosei-kai of Ramu**

**Rissho Kosei Dhamma Foundation, Sri Lanka**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
*Tel:* 94-11-2982406 *Fax*: 94-11-2982405

**Rissho Kosei-kai of Habarana**
151, Damulla Road, Habarana, Sri Lanka

**Rissho Kosei-kai of Polonnaruwa**

**Other Groups**
**Rissho Kosei-kai Friends in Shanghai**